Department of Education, Sabaragamuwa Province/ Weekly School


## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## සති පාසල පුනරීක්ෂණ පාඨමාලාව

බෞද්ධ ශිෂ්ටාචාරය | සතිය - 03

13 ශ්‍රේණිය | සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර


**(සතිමත්බව තුළින් යහපැවැත්ම උදෙසා)** **(කාලය - පැය 1 1/2 යි)**

07. නිපුණතාවː-

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා කැපවීමෙන් ක්‍රියා කරයි.

7.2. නිපුණතා මට්ටමː-

භාරතීය ථේරවාද ධර්ම සංගායනා පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක යෙදෙයි.

- ඉගෙනුම් ඵලː-
    - ථේරවාද ත්‍රිවිධ සංගායනාවන් හි පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.
    - අභියෝග හමුවේ ක්‍රියා කළ යුතු ආකාරය වටහා ගනියි.
    - ශාසනික වගකීම් හා කාර්ය භාරයන් ඉටුකරයි.
    - ශාසනික සුරක්ෂිතතාව පිණිස ක්‍රියාකරයි.
    (සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සිදු වූ ප්‍රථම, ද්විතීය හා තෘතිය ධර්ම සංගායනාවන් හි පසුබිම, සංගායනාවල මූලික තොරතුරු හා ප්‍රතිඵල පිළිබඳ සාමාලෝචනයක් මෙමගින් අපේක්ෂා කෙරේ.)

---

**විෂය අන්තර්ගතයට අදාළ පෙරහුරු පරීක්ෂණය**

(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න)

01. i. පඤ්චසතික ධර්ම සංගායනාව සඳහා බලපෑ මූලිකත්වය, දායකත්වය, පැවැත්වූ ස්ථානය හා පැවැත්වීමට බලපෑ හේතු පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 10)

    ii. පඤ්ච සතික ධර්ම සංගායනාව තුළින් හෙළිවන ප්‍රතිඵල පිළිබඳ ව සාකච්ඡා කරන්න. (ල. 10)

02. i. සත්ත සතික ධර්ම සංගායනාවට බලපෑ හේතු හා ඉන් ඇතිවූ ප්‍රතිඵල කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 10)

    ii. "ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සටහන් කළ සංගායනාවක් ලෙස දෙවන ධර්ම සංගායනාව සැලකේ" විමසන්න. (ල. 10)

03. i. ශාසන ව්‍යාප්තිය කෙරෙහි සහස්සසතික ධර්ම සංගායනාව උපකාරී වූ අයුරු විමර්ශනය කරන්න. (ල. 10)

    ii. සහස්සසතික ධර්ම සංගායනාවේ සාර්ථකත්වය උදෙසා බලපෑ මූලිකත්වය හා දායකත්වය විස්තරාතමකව පැහැදිලි කරන්න. (ල. 10)